OL/2017/16-S-I, II (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

16 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | |
|---|---|
| ඉස්ලාම් | I, II |
| இஸ்லாம் | I, II |
| Islam | I, II |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## ඉස්ලාම් I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** අල්-කුර්ආනයේ ඇති සූරා සංඛ්‍යාව,
(1) 286 කි. (2) 114 කි. (3) 88 කි. (4) 16 කි.

**2.** 'රිළා' යනු,
(1) කිසියම් කරුණක් සම්බන්ධයෙන් සෑහීමට පත්වීම ය.
(2) යමක් පිළිගෙන තෘප්තියට පත්වීම ය.
(3) යහපත කෙරෙහි ආශාවක් ඇති කර ගැනීම ය.
(4) අල්ලාහ්ගේ කැමත්ත කෙරෙහි සහතික වීම ය.

**3.** ඉතිහාසයේ 'යත්රිබ්' යැයි හඳුන්වනු ලැබූ නගරය කුමක් ද?
(1) කයිරෝ (2) මදීනා (3) මක්කා (4) කූබා

**4.** 'පොලිය' යන අදහස දෙන අරාබි වචනය
(1) මුලාරබා ය. (2) මුදාරභා ය. (3) රිබා ය. (4) බයිළ ය.

**5.** ඉබ්නු ඉස්හාක් විසින් ලියන ලද ඓතිහාසික ග්‍රන්ථය කුමක් ද?
(1) හිකායතුස් සහාබා (2) තබකාතුල් කබීර් (3) සීරතු රසූලිල්ලාහ් (4) මුකද්දිමා

**6.** මිහ්රාජයේ දී ලැබුණු අනිවාර්ය 'අමල්' යනු,
(1) පස්වේල් සලාතයයි. (2) රමළාන් මාසයේ සව්මයයි.
(3) සකාතයයි. (4) හජ් වන්දනාවයි.

**7.** 'තහ්සීර්' යනු,
(1) නියම කරන ලද දඬුවමයි. (2) වන්දි ඉල්ලීමයි.
(3) විනිශ්චයකරු තීරණය කරනු ලබන දඬුවමයි. (4) පළියට පළිය ගැනීමයි.

**8.** 'අල්ලාහ් වෙත වගකීම පැවරීම' යන්න දක්වන වචනය,
(1) තවක්කුල් ය. (2) වකාලත් ය. (3) ඊලාඋ ය. (4) තවාකුල් ය.

**9.** මැද ඉඳුමේ දී පාරායනය කරන 'රබ්බිහ් ෆිර්ලි වර්හම්නි...' යන්නෙහි ඊ ළඟ වචනය කුමක් ද?
(1) වර්ෆඋනි (2) වජ්බුර්නි (3) වර්සුක්නී (4) වහ්දිනී

**10.** අර්කානුල් කියාස්හි 'ඉල්ලත්' යනු,
(1) නීතියයි. (2) හේතුවයි. (3) මූලික කරුණයි. (4) ද්විතීය කරුණයි.

**11.** පොළොව සශ්‍රීක කරන ක්‍රියාවලිය,
(1) ඉමාරත් නම් වේ. (2) කිලාෆත් නම් වේ. (3) සිකායත් නම් වේ. (4) ඉබාදත් නම් වේ.

[ දෙවැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka

**12.** පහත දැක්වෙන පද යුගලවලින් සමාන අදහස් සහිත පද යුගලය තෝරන්න.
(1) මහ්රම්-අජ්නබි (2) හලාල්-හරාම් (3) මුජ්තහිද්-මුකල්ලිද් (4) ෆකීර්-මිස්කීන්

**13.** නබි දාවූද් (අලයි) තුමාගේ වෘත්තිය වූයේ,
(1) මැහුම් වැඩ ය. (2) කම්මල් වැඩ ය. (3) වෙළඳාම ය. (4) කෘෂි කර්මාන්තය ය.

**14.** පහත 'අ' තීරුවෙහි පද කිහිපයක් ද 'ආ' තීරුවෙහි ඒවායේ තේරුම ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) රිසාලත් | A - ආදේශ කිරීම |
| (ii) ෂිර්ක් | B - පවුල |
| (iii) උස්රත් | C - පිළිගැනීම |
| (iv) කබූල් | D - දූත මෙහෙවර |

මෙහි 'අ' යටතේ දැක්වෙන ඒවායේ අනුපිළිවෙළට 'ආ' යටතේ දැක්වෙන ඒවා නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) A B C B (2) B C A D (3) C A D B (4) D A B C

**15.** 'කව්ෆ්' හා 'රජාඋ' යන පදවල අදහස අනුපිළිවෙළින්
(1) බිය හා බලාපොරොත්තුව වේ. (2) තෘප්තිය හා ඉවසීම වේ.
(3) බිය හා සුරක්ෂිත බව වේ. (4) තෘප්තිය හා කනස්සල්ල වේ.

**16.** අයියාමුත් තෂ්රීක්වලට අයත් දින ගණන,
(1) 02 කි. (2) 03 කි. (3) 05 කි. (4) 07 කි.

**17.** "සැබවින් ම ප්‍රතික්ෂේප කරන්නන් හැර, අන් කිසිවෙකු අල්ලාහ්ගේ වරම කෙරෙහි විශ්වාසය අහිමි කර ගන්නේ නැත."
මෙය,
(1) අල්-කුර්ආන් වාක්‍යයකි. (2) ඉමාම්වරුන්ගේ අදහසකි.
(3) සහබාවරුන්ගේ අදහසකි. (4) අල්-හදීස් වාක්‍යයකි.

**18.** මදීනාවේ උපන් ඉමාම්වරයා,
(1) ඉමාම් මුස්ලිම් (රහ්) ය. (2) ඉමාම් මාලිකි (රහ්) ය. (3) ඉමාම් අහ්මද් (රහ්) ය. (4) ඉමාම් නසාඊ (රහ්) ය.

**19.** රත්රන්වල 'නිසාබ්' ප්‍රමාණය,
(1) ග්‍රෑම් 20 කි. (2) ග්‍රෑම් 85 කි. (3) ග්‍රෑම් 95 කි. (4) ග්‍රෑම් 672 කි.

**20.** පහත 'අ' තීරුවේ වැරදි කිහිපයක් ද 'ආ' තීරුවේ ඒවාට ඉස්ලාමය අනුමත කර ඇති දඬුවම් ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) රිද්දත් | A – කස පහර 80 |
| (ii) අපහාස | B – අත සිඳලීම |
| (iii) මත්පැන් පානය | C – මරණ දඬුවම |
| (iv) සොරකම | D – කස පහර 40 |

ඉහත 'අ' තීරුවට අනුව 'ආ' තීරුව නිවැරදිව ගළපා ඇති පිළිතුර ඇතුළත් වරණය කුමක් ද?
(1) A C B D (2) B A D C (3) C A D B (4) D B C A

**21.** හිජ්රතය සිදු වූ මාසය,
(1) මුහර්රම් ය. (2) රබීඋල් අව්වල් ය. (3) රජබ් ය. (4) රමළාන් ය.

**22.** හනීෆ්වරුන්ගෙන් කෙනෙකු වන්නේ,
(1) වරකා බින් නව්ෆල් ය. (2) අබූ සුෆ්යාන් බින් හර්බ් ය.
(3) අබූ තාලිබ් බින් අබ්දුල් මුත්තලිබ් ය. (4) කාලිද් බින් වලීද් ය.

**23.** අයකුගේ මරණය පිළිබඳ ප්‍රවෘත්තිය ලැබුණු විට උසුරනුයේ කුමක් ද?
(1) අල්හම්දුලිල්ලාහ් (2) යර්හමුකු මුල්ලාහ්
(3) ඉන්නාලිල්ලාහි වඉන්නා ඉලයිහි රාජිඌන් (4) නඌදු බිල්ලාහි මින්හා

**24.** නබි (සල්) තුමා මක්කාවට පිටින් දෑවා කාර්යය සඳහා ගිය ස්ථාන දෙකක් වන්නේ,
(1) කුෆා හා මදීනා ය. (2) යත්රිබ් හා තායිෆ් ය. (3) හබෂා හා ෂාම් ය. (4) යේමන් හා ජෙරුසලම ය.

**25.** 'උම්මුල් මසාකීන්' යන සුවිශේෂ නම ලැබූ මව්තුමිය,
(1) කදීජා (රළි) තුමියයි. (2) උම්මු හබීබා (රළි) තුමියයි. (3) සයිනබ් (රළි) තුමියයි. (4) උම්මු සල්මා (රළි) තුමියයි.

**26.** වසර දහයක් ඉහ්තිකාෆ් ඉටු කිරීමට වඩා වැඩි යහඵලය ගෙන දෙන්නක් බව නබිතුමා විසින් පවසා ඇති කාර්යය,
(1) දෙමව්පියන්ට ගරු කිරීම ය. (2) සොයුරෙකුගේ අවශ්‍යතාවක් ඉටු කර ගැනීමට සහාය වීම ය.
(3) අනාථයින් සුරැකීම ය. (4) දෙවියන්ගේ මාර්ගයේ සටන් කිරීම ය.

[ තුන්වැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**27.** පහත දැක්වෙන ඒවායින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඉජ්මාඋල් අක්ෂරියා යනු පිළිගත් තීන්දුවයි.
(2) මනාලිය විසින් මනාලයාට මහර් දෙනු ලැබේ.
(3) ව්‍යාජ නබිත්වය කලීෆා අබූබක්ර්ගේ කාලයෙන් අවසන් විය.
(4) කුල්ලතයින්ට වඩා වැඩි ජලය 'අල්-මාඋල් කලීල්' යනුවෙන් හැඳින්වේ.

**28.** ක්‍රියාවට අදාළ කුෆ්රයට උදාහරණයක් වන්නේ,
(1) කියාමාව ප්‍රතික්ෂේප කිරීම ය.
(2) අල්ලාහ්ට සමව අන් යමකට වැඳුම් පිදුම් කිරීම ය.
(3) නබිතුමාට අපහාස කිරීම ය.
(4) අල්ලාහ්ගේ ශුද්ධ වූ නම් ප්‍රතික්ෂේප කිරීම ය.

**29.** 'සදකතුල් ජාරියා' යනු
(1) සැමදා යහපත ගෙන දෙන ස්ථිර ධර්මය ය.
(2) අල්ලාහ් හා ගැත්තා අතර සම්බන්ධතාව ය.
(3) රමළාන් මාසය අවසානයේ ලබා දෙන සදකාව ය.
(4) දුගී දුප්පතුන්ට අසීමිතව දන් දීම ය.

**30.** 'අස්සිහාහුස් සිත්තා' යනු,
(1) ෆික්හ් ග්‍රන්ථ හය ය.
(2) විශ්වාස කළ හැකි හදීස් ග්‍රන්ථ හය ය.
(3) ඉතිහාස ක්ෂේත්‍රය පිළිබඳ ග්‍රන්ථ හයකි.
(4) සුප්‍රසිද්ධ වෛද්‍ය ග්‍රන්ථ වේ.

**31.** අල්-කුර්ආනය සඳහන් කරන, සකාත් ලැබීමට සුදුස්සසන් වන කණ්ඩායම් ගණන,
(1) 6 කි.
(2) 7 කි.
(3) 8 කි.
(4) 10 කි.

**32.** කාන්තාවන් පිරිමින් වෙත පවරන ලද වගකීමක් බව නබිතුමා පැවසුවේ,
(1) මක්කා ජයග්‍රහණයේ දී ය.
(2) කදීජා (රළි) තුමිය වෆාත් වූ විට ය.
(3) මදීනා ගිවිසුමේ දී ය.
(4) හජ්ජතුල් විදා අවස්ථාවේ දී ය.

**33.** පහත සඳහන් අය අතුරින් 'අහ්ලුල් බෛත්'වලට අයත් වනුයේ,
(1) අබූ හුරයිරා (රළි) ය.
(2) අම්මාර් (රළි) ය.
(3) සඃද් බින් අබී වක්කාස් (රළි) ය.
(4) අබ්බාස් (රළි) ය.

**34.** ස්වමයේ ෆර්ල් දෙකෙන් පළමුවැන්න නියතය වන අතර දෙවැන්න,
(1) සවමය ඉටු කිරීමට ශක්තිය තිබීම ය.
(2) ඉර උදාවේ සිට ඉර බැස යන තෙක් සවමය බිඳෙන කිසිදු කාර්යයක නොයෙදීම ය.
(3) සුබ්හු සලාතයට පෙර සහර් ඉටු කිරීම ය.
(4) රමළාන් මාසයේ රාත්‍රි සලාතවල යෙදීම ය.

**35.** පහත 'අ' තීරුව හා 'ආ' තීරුව යටතේ ඇති ඒවා සලකා බලන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) – අජාඉබුල් හින්ද් | A – කානූන් |
| (ii) – සෝනහර් | B – ඉබ්නු සහ්රයාර් |
| (iii) – අල්-හාවි | C – වාන් සන්ඩේන් |
| (iv) – අලි බින් සීනා | D – සකරිය්යා අර්-රාසි |

ඉහත 'අ' තීරුවට අනුව 'ආ' තීරුව නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) A B C D
(2) B C D A
(3) C B A D
(4) D A B C

**36.** 'තලාක් රජ්ඊ' යනු,
(1) ඉල්ලා අස්කරගත හැකි තලාක් ය.
(2) සම්පූර්ණ වූ තලාක් ය.
(3) සැමියා හා බිරිඳ වෙන් කර තැබීම ය.
(4) බිරිඳ සැමියාගෙන් දික්කසාද ඉල්ලීම ය.

**37.** පහත සඳහන් ඒවායින් නබිතුමා හැඳින්වෙන්නේ කුමකින් ද?
(1) රබ්බුන්නාස්
(2) හුදන් ලින්නාස්
(3) රබ්බුල් ආලමීන්
(4) රහ්මතන් ලිල් ආලමීන්

**38.** 'මුහද්දිස්' යනු,
(1) ෆික්හ් ක්ෂේත්‍රයේ විද්වතෙකි.
(2) කුර්ආන් විවරණ කරන්නා ය.
(3) හදීස් ක්ෂේත්‍රයේ විද්වතෙකි.
(4) ඉජ්තිහාද් කරන්නා ය.

**39.** "ආගමේ බල කිරීමක් නැත." යනු
(1) හදීස් වාක්‍යයකි.
(2) අල්-කුර්ආන් වාක්‍යයකි.
(3) කලීෆා උමර් (රළි) තුමාගේ ප්‍රකාශයකි.
(4) ඉමාම් අහ්මද් බින් හන්බලි (රහ්) තුමාගේ අදහසකි.

**40.** අකීදා ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ මතය අනුව භෞතික ලෝකයටත් ඉන්ද්‍රියවලටත් පරිබාහිර කරුණු ඇතුළත් කොටස,
(1) අල්-ඉලාහිය්යාත් ය.
(2) අන්-නුබුව්වාත් ය.
(3) අෂ්-ෂම්ඉය්යාත් ය.
(4) අර්-රූහානිය්යාත් ය.

* *



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

*සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]*

**පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus**

**OLD**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2017**

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

## ඉස්ලාම් II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) සව්මය බිඳවන කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(ii) හුකූකුල්ලාහ්, හුකූකුල් ඉබාද් යන ඒවා අර්ථකථනය කරන්න.

(iii) කලීෆා අබූබක්ර් (රළි) තුමා විසින් ජයගත් ව්‍යාජ නබිවරුන් **දෙදෙනකුගේ** නම් ලියන්න.

(iv) බුහාරා හා තිර්මිද් යන ප්‍රදේශවල උපන් මුහද්දිස්වරු **දෙදෙනකුගේ** නම් ලියන්න.

(v) තමන් උපයා ලබා ගැනීමට අමතරව වස්තු ලැබෙන ආකාර **දෙක** මොනවා ද?

(vi) 'හද්' කොටසට යටත් වන වැරදි **දෙකක්** සඳහන් කරන්න.

(vii) උස්මාන් (රළි) තුමාට ලැබුණු සුවිශේෂ නම් **දෙක** මොනවා ද?

(viii) මිහ්රාජ් ගමන සඳහා යොදා ගත් සත්ත්වයාගේ නමත්, සලාතය සම්බන්ධයෙන් නබිතුමාට උපදෙස් ලබා දුන් නබිවරයාගේ නමත් ලියන්න.

(ix) මවගේ අගය හා තත්ත්වය විදහා දක්වන ආකාරයෙන් නබි (සල්) තුමා පැවසූ හදීසයක් හා එහි තේරුම ලියා දක්වන්න.

(x) මානසික සෞඛ්‍යයට හානි කරන කරුණු **දෙකක්** සඳහන් කරන්න.

**2.** (i) ෆර්ල්හි ආකාර **දෙක** මොනවා ද?

(ii) ජනාසාවට අදාළ ෆර්ල් **තුන** සඳහන් කරන්න.

(iii) ජනාසාවට සහභාගි වීමෙන් ලබා ගත හැකි ඉගෙනුම් මොනවා ද?

**3.** (i) 'හදීස්' යන්නෙහි පාරිභාෂික තේරුම ලියන්න.

(ii) සව්මය ඉටු කිරීමෙන් නිදහස් කර ඇති කණ්ඩායම් **තුන** සඳහන් කරන්න.

(iii) මුජ්තහිද්වරුන් ලබා තිබිය යුතු සුදුසුකම් **පහ** කෙටියෙන් පැහැදිලි කරන්න.

**4.** (i) 'මුහාසබා' යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?

(ii) ඉස්ලාමීය සාපරාධී දඬුවම් වර්ග **තුන** සඳහන් කරන්න.

(iii) අපරාධ සිදු **නොවීමට** ඉස්ලාම් දක්වා ඇති විධික්‍රම **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

**5.** (i) නබිතුමා හිජ්රත් ගියේ කුමන ස්ථානයක සිට කුමන ස්ථානයකට ද?

(ii) හුදයිබිය්යා ගිවිසුමේ කොන්දේසි **තුනක්** සඳහන් කරන්න.

(iii) හජ්ජතුල් විදාඃ හි ඉදිරිපත් කළ උපදෙස් **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**6.** (i) සලාතයේ පළමු රක්අතයේ ඇතුළත් ෆර්ල් **දෙකක්** සඳහන් කරන්න.

(ii) සකාත් නියම වන භාණ්ඩ **තුනක්** නම් කරන්න.

(iii) සකාත් ලැබීමට සුදුසු කණ්ඩායම් **පහක්** කෙටියෙන් හඳුන්වන්න.

**7.** (i) 'තව්බා' යනු කුමක් ද?

(ii) තව්බාවේ දී අනිවාර්යයෙන් රැක ගත යුතු කරුණු **තුන** මොනවා ද?

(iii) වර්තමානයේ තාරුණ්‍යය යහමගට යොමු කිරීමට සුදුසු යෝජනා **පහක්** ඉදිරිපත් කරන්න.

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka